# එළු පාලනය

# මස් සඳහා එළුවන් ඇති කිරීම

**සාගරිකා ජයලත් මැණිකේ හිටිහාමු.**

*පර්යේෂණ නිලධාරිණී*

**කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

**ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලන කටයුතු අතීතයේ සිට මේ දක්වා කෘෂි ආර්ථික රටාවට අනුයුක්තව බැඳී පවතී. මෙහි දී, ගව පාලනය සඳහා සුවිශේෂී තැනක් හිමි වේ.** ශ්‍රී ලංකාවේ පවතින විවිධ ගැටළු සහගත තත්ත්ව යටතේ මස් පිණිස ගවයන් ඇති කිරීම සීමා වී තිබේ. **ගව පාලනය** සඳහා දියුණු ගව වර්ග බෝ කිරීම හා අවශ්‍ය තෘණ බිම් සකස් කිරීම සඳහා අනෙකුත් සතුන් සමඟ සසඳා බලන කල දීර්ඝ කාලයක් ගත වේ. මෙරට වැඩි වන ජනගහනයට අනුව, අවශ්‍ය මස් සඳහා පවතින ඉල්ලුම සපුරාලීම පිණිස දැනට නිපදවන ගව මස් ප්‍රමාණවත් නොවේ.

සෑම සත්ත්ව පාලන ව්‍යාපාරයකටම වඩා මසට එළුවන් ඇති කිරීමේ විශාල හැකියාවක් මෙරට පවතී. එමෙන්ම, එළු මස් සඳහා ඇති ඉල්ලුම ද ක්‍රමයෙන් වැඩි වේ. වෙනත් සත්ත්ව පාලන ව්‍යාපෘති හා සසඳා බලන විට මෙය ඉතා ලාභදායක වූවකි. ඊට අමතරව, මේ සඳහා විශේෂ වූ දැනුමක් හා විශාල ඉඩ ප්‍රමාණයක් ද අවශ්‍ය නොවේ.

## යෝග්‍ය ප්‍රදේශ

**ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශ-යක එළු පාලනය සිදු කල හැකි වුවත්, ඒ සඳහා වඩා යෝග්‍ය වන්නේ වියලි කලාපය යි.** විශේෂයෙන්, වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා නොගත් **පුත්තලම, මන්නාරම, ත්‍රිකුණා-මලය, මඩකලපුව හා හම්බන්තොට** වැනි ප්‍රදේශයන් හි මේ සඳහා ඉතාමත් හිතකර තත්ත්ව පවතී. මෙම ප්‍රදේශවල පවතින පඳුරු සහිත ලඳු කැලෑ බිම් මඟින් එළුවන්ට අවශ්‍ය ආහාර ප්‍රමාණය ලබා ගත හැකිය. එළුවෙකුට අවශ්‍ය බිම් ප්‍රමාණය නිසැක වශයෙන්ම කිව නොහැකි වුවත් හොඳින් වැවෙන ශාක සහිත **ග්ලිසිඩියා, ගම්සූරියා** වැනි ගස් වර්ග වලින් වැටවල් සමන්විත අක්කරයක ඉඩම් ප්‍රමාණය එළුවන් 05 දෙනෙකු පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් ය.

## බෝ කිරීම

ශ්‍රී ලංකාවේ එළු පාලනය සඳහා සතුන් සොයා ගැනීම එතරම් අපහසු නොවේ. දේශීය එළුවන් සාමාන්‍ය කුඩා සිරුරකින් යුක්ත වුවත් එක් සතෙකුගෙන් මස් කි.ග්‍රෑ. 9-11 ත් අතර ප්‍රමාණයක් පහසුවෙන් ලබාගත හැකිය. දේශීය සතුන්, **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** මඟින් හඳුන්වා දී ඇති **බිකනාරේ, මැඩ්රාස් රෙඩ්** හා **බෝයර්** වැනි පුළුල් සිරුරකින් යුතු දියුණු වර්ග සමඟ දෙමුහුන් කිරීමෙන් වැඩි දියුණු කර ගත හැකි වේ. එළු දෙනුන් වසරකට දෙවරක් පැටවුන් බිහි කරන හෙයින් පැටවුන් බෝ කර ගැනීමට වැඩි කාලයක් ගත නොවේ. පට්ටි දැමීම සඳහා දෙනුන් 30 ක් සඳහා එක් එළුවෙකු සෑහෙන අතර සතුන් පළමු වරට පට්ටියට දැමීම සඳහා අඩුම වශයෙන් අවුරුද්දක්වත් වයස සම්පූර්ණ විය යුතුය. දෙනෙකුගේ පට්ටි දැමීමේ ලක්ෂණ (මද) පහළ වීමේ චක්‍රය දින 17-21 අතර වේ.

## ආහාර ලබාදීම

මසට එළුවන් ඇති කිරීමේ දී අවශ්‍ය සම්පූර්ණ ආහාර ප්‍රමාණය උලා කෑමට ඉඩ හැරීම මඟින් සපුරාලිය හැකි වුව ද, පට්ටි දැමීම සඳහා ඇති කරන පිරිමි සතුන් සඳහා සාන්ද්‍ර ආහාර යම් ප්‍රමාණයක් සැපයිය යුතුය. මේ සඳහා සහල් නිවුඩු හා පොල් පුන්නක්කු අවශ්‍ය පරිදි සමානව මිශ්‍ර කර ඛණිජ මිශ්‍රනය ද අවුන්ස 01 ක් මිශ්‍ර කර දිනපතා ලබාදීම කල යුතුය.

## නිවාස

ගව පාලනයේ දී හෝ කුකුල් පාලනයේ දී මෙන් ක්‍රමවත් නිවාස එළුවන් සඳහා අවශ්‍ය නොවේ. ඉඩෝර-යෙන් ආරක්ෂා වීම සඳහා සකස් කරන ලද සරල එළු මඩු මේ සඳහා සෑහේ. මෙම මඩු, ලී අඩු උපයෝගී කරගෙන ඉතා අඩු වියදමකින් සාදා ගත හැකිය. එළු කොටුවක් සෑදීමේ දී වඩා වැදගත් වන්නේ පොළවේ සිට අඩි 03 ක් ඉහලින් පිහිටන ලෙස පහසුවෙන් අපද්‍රව්‍ය ඉවත්කල හැකි වන පරිදි එළු මඩුවේ මතුපිට සකස් කිරීම යි. එක් සතෙකු සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණය වර්ග මීටර් 02 කි. බිම පිරිසිදු කල හැකි බෑවුමකින් යුක්ත විය යුතුය. අයහපත් වාතාශ්‍රය හා සතුන් ගහනය වැඩිවීමේ හේතු -වෙන් සතුනට **නියුමෝනියා** රෝගය වැළඳිය හැකිය. එළුවන් ඇති කිරීම පහසු කාර්යයක් වුව ද, මෙහි දී සැලකිලිමත් විය යුතු කරුණු තිබේ. **උලා කෑම සඳහා ඇති තෘණ බිම් ප්‍රමාණය සීමාසහිත නිසා එළුවන් හා ගවයන් එකට ඇති කිරීම බොහෝ ගොවියන් සිදු කරන වරදකි.** මෙසේ සතුන් දෙවර්ගයම එකට උලා කෑමේ දී, එළු පක්ෂඝාත රෝගය වැළඳිය හැකිය. **එළු පක්ෂඝාත රෝගය ගවයන්ගේ ජීර්ණ පද්ධතියේ ජීවත් වන පනුවෙකු ගෙන් බෝවේ.** ගව ජීර්ණ පද්ධතියේ සිටින පනුවන් ගොම මඟින් ගව ශරීරයෙන් පිටතට වීත් තෘණ

මඟින් එළුවාගේ ශරීරයට ඇතුල් වේ. එසේ ඇතුළු වන පනුවන් එළුවන්ගේ මොලයේ හා කොඳු නාරටියේ ජීවත් වේ. මෙම රෝගය වැළඳීමෙන් සතුන්ගේ ශරීරයේ එක් පැත්තක් පණ නැති වීම හෝ අප්‍රාණික වීම සිදු වේ. මේ සඳහා ප්‍රතිකාරයක් නොමැති අතර කළයුත්තේ එළුවන් හා ගවයන් එකට පාලනය නොකිරීම යි.

## තෙත් කාලයේ රැක බලා ගැනීම

වියළි හා අර්ධ වියළි තත්ත්ව යටතේ එළුවන් පහසුවෙන් ඇතිකළ හැකි වුවත්, තෙත් කාලගුණයේ දී සතුන් ප්‍රධාන රෝග දෙකකට ගොදුරු වේ.

(i) ගැස්ටෝ එන්ටෙරිටිස් නෙමටෝඩ් (පනුවන්) මඟින්

(ii) පාද කුණුවීම (බැක්ටීරියා) මඟින්

### ගැස්ටෝඑන්ටෙරිටිස්

වැඩුණු සතුන් හා විශේෂයෙන් එළු පැටවුන් මේ රෝග වලට ගොදුරු වේ. කුඩා සතුන් මවු සතුන් සමඟ තණකොළ උලා කෑමට යෑමෙන් මේ උවදුරට ගොදුරු වීම සිදු වේ. සතුන් මෙම උවදුරින් වළක්වා ගැනීම සඳහා පැටවුන් ඉපදී පළමුවන සතියේ හා නැවත මසකට පසු පනු බෙහෙත් ලබා දිය යුතු වේ. නිර්දේශිත පනු බෙහෙත්, වට පනුවන් මර්ධනය කිරීම සඳහා **නිල්වර්ම් හා තයොබෙන්ඩසෝල්,** පටි පනුවන් මර්ධනය සඳහා **මැන්සනිල් ය.**

### පාද කුණුවීම

**වියළි කාලයේ දී, වියළි හා තද බවකින් යුතුව තිබී තෙත් කාලගුණයේ දී මෘදු බවකට පත්වන කුර තුලින් බැක්ටීරියා ශරීර ගත වීම මඟින් පාද කුණු වීමේ රෝගයට එළුවන් භාජනය වේ.** මෙය සතුනට ඉතා වේදනාකාරී රෝගයකි. මඩ සහිත ප්‍රදේශ වල මෙය සීඝ්‍රයෙන් පැතිරේ. රෝගය වැළැක්වීම සඳහා සතුන් කොටු තුළට ඇතුළු වීමේ දී **10% බ්ලූස්ටෝන් (කොපර් සල්ෆේට්)** ද්‍රාවණයකින් පාද සේදීමට සැලැස්විය යුතුය.

කිනිතුල්ලන් පාලනය කිරීම **ඇසන්ටොල්** භාවිතයෙන් සිදු කළ හැකිය. මැක්කන් පාලනය කිරීමේ දී නිතර පරීක්ෂා කර **නෙගුවොන්** වලින් ප්‍රතිකාර කළ හැකිය.

## කිරි සඳහා එළුවන් ඇති කිරීම

කිරි සඳහා ගවයන් ඇති කිරීම හා සසඳා බැලීමේ දී, කිරි සඳහා එළුවන් ඇති කිරීමේ විශේෂ වාසි කිහිපයක් පවතී. එනම් සුළු මුදලක් අවශ්‍ය වීම, අඩු ආහාර ප්‍රමාණයක් අවශ්‍ය වීම, (එළ දෙනෙකුට අවශ්‍ය ආහාර ප්‍රමාණයෙන් එළුවන් 07 දෙනෙකු ඇති කල හැකිය.) සතුන් ඉතා ඉක්මනින් බෝ වීම, සතුන්ගේ ජීවිත කාලය දීර්ඝ වීම යනාදිය යි. ඉහත සඳහන් විශේෂ වාසි පැවතිය ද, කිරට එළුවන් ඇති කිරීමේ විශේෂ ප්‍රවණතාවයක් මේ දක්වා ඇති වී නොමැත. එයට හේතු වන්නේ එළු පාලනයේ පුරුද්දක් නොමැති කම, කිරි සඳහා

> **වියලි කාලයේ දී වියලි හා තද බවකින් යුතුව තිබී තෙත් කාලගුණයේ දී මෘදු බවකට පත්වන කුර තුලින් බැක්ටීරියා ශරීර ගත වීම මඟින් පාද කුණු වීමේ රෝගයට එළුවන් භාජනය වේ.**

එළු පාලනය කිරීමේ විශේෂ සැලකිල්ලක් නොදැක්වීම හා එළු කිරි පානය කිරීමේ විශේෂ රුචියක් නොදැක්වීම යි. එළු කිරි මේද ප්‍රතිශතය හා සසඳා බැලීමේ දී, මවුකිරි හා සමානය. එළුකිරි ජනප්‍රිය ක්ෂණික ආහාරයක් ලෙස බොහෝ ආසියාතික රටවල මෙන්ම **ග්‍රීසිය, ස්විස්ටර්ලන්තය** වැනි රටවල ද ප්‍රසිද්ධියක් උසුලයි. **ස්විස්ටර්ලන්තයේ** එළුවා, ළදරුවා ගේ කිරි මව ලෙස ද හඳුන්වනු ලැබේ. එළු කිරි ඖෂධීය ගුණයෙන් ද ඉතා ඉහළ මට්ටමක පවතී. මන්ද පෝෂණයෙන් පෙළෙන්නවුන් සඳහා ද එළු කිරි නිර්දේශ කෙරේ. ඊට අමතරව රෝග සඳහා ප්‍රතිශක්ති බලයක් ද එළු කිරිවල පවතී. මී කිරි වලට සමානව මුදවපු කිරි එළු කිරි වලින් ලබා ගත හැකි ය.

දේශීය වර්ගයේ සතුන් ගෙන් දිනකට කිරි බෝතල් 1/2 සිට 1 දක්වා ලබා ගැනීමට පුළුවන. කෙසේ වුව ද නුමුහුන් **ජම්නාපාරී** හා **සනෙන්ස්** වර්ග සමඟ දේශීය සතුන් මුහුන් කිරීමෙන් ලැබෙන සතුන් දිනකට කිරි බෝතල් 3 ක් පමණ ලබා දේ. මනා පාලන තත්ත්ව යටතේ කිරි මුරයක් මාස 9-10 දක්වා කාලයක් පවත්වා ගත හැකිය. කිරි සඳහා එළුවන් ඇති කිරීමේ දී සතුන් බෝ කිරීම ඉතා වැදගත් පියවරකි. එළුවන් ඉතා ඉක්මනින් වැඩෙන නමුත් පට්ටියට යැවීමේ දී වැස්සියන් අඩුම වශයෙන් මාස 15 ක් ද, වස්සන් අවුරුද්දක් පමණවත් වයස් ගත විය යුතුය. ඊට අඩු වයසේ බිහිවන පැටවුන් ගෙන් ඇති වන වැස්සියන්ගෙන් ලැබෙන කිරි ප්‍රමාණය අඩුය. එබැවින්, නියම වයසට පත් වන තෙක් වස්සන් හා වැස්සියන් වෙන් කර ඇති කල යුතුය. එළුවෙකුගේ ගැබ් කාලය මාස 05 ක් පමණ වේ. සාමාන්‍යයෙන් අවුරුද්දකට දෙවරක් පැටවු ලබා ගැනීමේ හැකියාවක් පවතී. මෙරට අයහපත් ආහාර තත්ත්ව නිසා කිරි සඳහා ඇති කරන සතුන්ගෙන් අවුරුද්දකට දෙවරක් පැටවු ලබා නොගත යුතුය. අවුරුද්දකට පැටවු දෙවරක් ලබා ගතහොත් දෙනගේ කිරි මුරය, ගැබ් කාලය මැද හරියේ දී නතර වේ. ඊට අමතරව ලැබෙන පැටවු සෞඛ්‍ය හා වැඩීම අතින් දුර්වල වේ.

හොඳ නිෂ්පාදනයක් උදෙසා එළු දෙනුන් මිල දී ගැනීමේ දී කරුණු කිහිපයක් සැලකිය යුතුය. හොඳ එළු දෙනක් නිරෝගී හා එඩිතර විය යුතුය. ඇගේ පාද ඍජුව තිබිය යුතු අතර පමණට වඩා කුර නොවැඩී තිබිය යුතුය. **ලොම් මෘදු සියුම් බවකින් යුක්ත විය යුතුය.** සිරුරෙන් පිටතට එල්ලා හැලෙන ලොම් සහිත සතුන් නුසුදුසු වන අතර ඔවුන්ගේ නිෂ්පාදනය අඩුය. නිෂ්පාදන ධාරිතාව වැඩි සතුන්ගේ කිරි බුරුල්ල පැතිරී ගිය විශාල එකක් විය යුතුය.